## මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - 2014

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වන වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් වූ දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු.46,379,016 ක් වූ දේපල පිරියත උපකරණවල සාධාරණ අගය පිළිබිඹු නොවන බැවින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වැනි වගන්තිය අනුව උසස් අධ්‍යාපන ආයතන විසින් කුමන ප්‍රභවයකින් හෝ උපයනු ලබන සියළුම ආදායම් එම ආයතනයේ අරමුදලට බැරකළ යුතු බව නියම කර තිබියදී එයට පටහැනිව ප්‍රෙපරටරි (Preporatory) පාඨමාලා ආදායම් සහ ජාතික තාක්ෂණික පාඨමාලා අයදුම්පත් ආදායම් වෙනම විලම්භිත ආදායම් ගිණුම්වල බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මෙම ගිණුම්වලින් රු.933,634 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සේවකයන් අතර බෙදා දී තිබූ අතර මෙම ගෙවීම සඳහා උපදේශක සේවා භාරගැනීම සඳහා වූ රාජ්‍ය මුදල් අංක 380 චක්‍රලේඛය වැරදි සහගත ලෙස අර්ථකථනය කර තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව ආයතනයේ සේවයේ නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛණවල සටහන් කළ යුතු නමුත් එයට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු.50,922,656 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.682,036 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,804,799 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,486,835 ක

**පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.8,980,000 කින් වැඩිවී තිබුණද, කාර්යමණ්ඩල පාරිශ්‍රමික රු.14,979,419 කින් වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා 09 ක් පවත්වනු ලබන අතර 2010 වර්ෂයේදී ඩිප්ලෝමා සඳහා බඳවා ගත් ශිෂ්‍යයින් 360 කින් සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් 283 ක් හෙවත් සියයට 79 ක් සමත් වී තිබුණි.**

**(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු.137,658,274 ක් වීම නිසා ඒක ශිෂ්‍ය පිරිවැය රු.202,737 ක් වී තිබුණි.**

**(ඇ) සමාලෝචිත වර්ෂය තුල මහපොළ ශිෂ්‍යත්ව ආධාර වශයෙන් ශිෂ්‍යයින් 206 කට රු.2,396,600 ක් ගෙවා තිබු අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 428 කට රු.13,412,700 ක් ගෙවා තිබුණි.**

**(ඈ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන සති 30 ක් තුළ දේශන පැය 20,999 ක් පවත්වා තිබු අතර ඉන් සියයට 48 ක් අධ්‍යයන අවශ්‍යතා මත බාහිර දේශකවරුන් මගින් දේශන පවත්වා තිබුණි. අභ්‍යන්තර දේශන පැය 10,925 ක වියදම හා බාහිර දේශන පැය 10,074 ක වියදම පිළිවෙලින් රු.50,922,656 ක් හා රු.14,246,700 ක් වී තිබුණි.**

**4.2 අරමුදල් ඌන උපයෝජනය**

**වෙළඳ නාවික නිලධාරීන් පුහුණු වැඩසටහන සහ සමුද්‍ර ඉංජිනේරු හා නාවික ඉංජිනේරු අරමුදලේ වටිනාකම වන රු.7,970,715 ක් අදාල අරමුණුගත කාර්යයන්ට නොයොදා වසර 10 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.**

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

**2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආධුනික කථිකාචාර්ය තනතුරු 15 ක් හා අනෙකුත් කාර්ය මණ්ඩලයට අදාල මාණ්ඩලික නොවන තනතුරු 12 ක් පුරප්පාඩුව පැවතුණි.**

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

**2011 සිට 2015 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද ඒ සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය විගණිත දිනය දක්වා ලබාගෙන නොතිබුණි.**

**6. පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.**

**(අ) ගිණුම්කරණය**
**(ආ) උපයෝගී ලේඛණ**
**(ඇ) සේවක ණය පාලනය**
**(ඈ) වත්කම් කළමනාකරණය**
**(ඉ) අත්තිකාරම්**